# අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය**

**10/11 ශ්‍රේණි සඳහා වීඩියෝ පාඩම් මාලාවට අදාළ ක්‍රියාකාරකම්**

**10 ශ්‍රේණිය - පරිච්ඡේදය 03 - ව්‍යාපාර සංවිධාන**

**හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීම**

....................................................................................................................................

**01. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක i හා ii ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

පාසල් අධ්‍යාපනය අවසන් කළ සඳමාල්, "සඳගල නිෂ්පාදකයෝ" නමින් ඇතුරුම් ගල් නිෂ්පාදන ව්‍යාපාරයක් නගරයේ විවිධ සේවා සමූපකාර සමිතිය අසල ආරම්භ කරන ලදී. ඇතුරුම් ගල්වලට පවතින ඉල්ලුම ඉහළ යාමත් සමග ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සඳහා ඔහු ලංකා බැංකුවෙන් ණය මුදලක් ලබාගෙන කුඩා ලොරි රථයක් මිලට ගන්නා ලදී. ගෙවතු අලංකරණ කටයුතු සිදුකරන සමාගමක් වන සී/ස සිහින ගාඩ්න්ස් සමාගම විසින් සඳමාල්ට ඇතුරුම් ගල් 50 000 ක ඇණවුමක් ලබා දෙන ලදී.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ව විශ්‍රාම ලැබ සිටින සඳමාල්ගේ පියා ද ඔහුගේ ව්‍යාපාරික කටයුතුවලට සහය දක්වයි. සඳමාල් විසින් ගමේ මරණාධාර සමිතිය වන එක්සත් මරණාධාර සමිතියේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පූර්ණ අනුග්‍රාහකත්වය ලබාදෙන ලදී.

ව්‍යාපාර කටයුතු පුළුල් වීමත් සමඟ ඔහුගේ සහෝදරයෙකු වූ සඳරුවන් ද සම්බන්ධ කරගෙන වැඩි ප්‍රාග්ධනයක් සහිතව "සඳගල සහෝදරයෝ" නමින් ව්‍යාපාරය වෙනස් කරන ලදී.

i. ඉහත සිද්ධියෙහි ඇතුළත් ව්‍යාපාර සංවිධාන නම් කර ඒවා අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය ලියා දක්වන්න.
   නිදසුන:- සඳගල නිෂ්පාදකයෝ - ඒක පුද්ගල ව්‍යාපාර
ii. ඉහත (i) හි ඔබ හඳුනා ගත් ව්‍යාපාර සංවිධාන වර්ග හිමිකාරිත්වය අනුව වර්ග කර දක්වන්න.

**02. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.**

(අ). සෑම ව්‍යාපාර සංවිධානයක් මගින් ම මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීමක් සිදු වේ. ( )
(ආ). හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරනු ලබන්නේ පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා පොදු අංශයේ ව්‍යාපාර යනුවෙනි. ( )
(ඉ). සමූපකාර සමිති රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි. ( )
(ඊ). රාජ්‍ය දෙපාර්තමේන්තු පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයකි. ( )

**03. කෙටි පිළිතුරු සපයන්න.**

1. ව්‍යාපාර සංවිධානයක් යනු කුමක්ද?
2. ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමට යොදා ගන්නා නිර්ණායක මොනවාද?
3. හිමිකාරිත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න.
4. ඔබ ප්‍රදේශයේ ඇති තැපැල් කාර්යාලය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද?
5. ඔබේ පාසල කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත් වේ ද?

**04.** **නිවැරදි පිළිතුර තෝරන්න.**

1. පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන **පමණක්** අඩංගු පිළිතුර වන්නේ,
   (1). ඒක පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හා රාජ්‍ය දෙපාර්තමේන්තු ය.
   (2). රාජ්‍ය දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා සමූපකාර සමිති ය.
   (3). ඒක පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර හා සමූපකාර සමිති ය.
   (4). සමූපකාර සමිති, සමිති සංවිධාන හා රාජ්‍ය සමාගම් ය.

2. පෞද්ගලික අංශයට අයත් **නොවන** ව්‍යාපාර සංවිධාන වර්ගයක් වන්නේ,
   (1). හවුල් ව්‍යාපාර ය.
   (2). රාජ්‍ය සංස්ථා ය.
   (3). සංස්ථාපිත සමාගම් ය.
   (4). සමූපකාර සමිති ය.

3. පෞද්ගලික අංශය හා පොදු අංශය ලෙස ව්‍යාපාර වර්ග කර දක්වන නිර්ණායකය වන්නේ,
   (1). පරිමාණය අනුව ය.
   (2). හිමිකාරිත්වය අනුව ය.
   (3). ව්‍යාපාර ස්වභාවය අනුව ය.
   (4). අරමුණ අනුව ය.

4. ජයතුංග පෙරේරා මහතා "ජය මිල්ස්" නමින් වී මිලදී ගෙන සහල් බවට පත් කර අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලබයි.
   "ජය මිල්ස්" ව්‍යාපාරය අයත් වන ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
   (1). හවුල් ව්‍යාපාර ය.
   (2). ඒක පුද්ගල ව්‍යාපාර ය.
   (3). සංස්ථාපිත සමාගම් ය.
   (4). සමූපකාර සමිති ය.

5. පහත X තීරුවේ ව්‍යාපාර සංවිධාන වර්ග ද Y තීරුවේ ඊට අදාළ නිදසුන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| 1. ඒක පුද්ගල ව්‍යාපාර | A. අමා සහ ටානි ෆැෂන් හවුස් |
| 2. හවුල් ව්‍යාපාර | B. අමා ෆැෂන් හවුස් |
| 3. රාජ්‍ය සංස්ථා | C. ශ්‍රී ලංකා ටෙලිකොම් (පුද්.) සමාගම |
| 4. රාජ්‍ය සමාගම් | D. රූපවාහිනී සංස්ථාව |

X හා Y තීරු නිවැරදිව ගළපා ඇති පිළිතුර වන්නේ,

   (1). B, A, D හා C ය.
   (2). B, D, C හා A ය.
   (3). C, A, B හා D ය.
   (4). A, B, C හා D ය.

**05.** මෙම පාඩම අධ්‍යයනයෙන් ඔබ ඉගෙන ගත් ව්‍යාපාර සංවිධාන වර්ග සඳහා ඔබ අවට පරිසරයේ පවතින නිදසුන් 2 බැගින් හඳුනා ගන්න.